**කල්මුණ මහා නගර සභාව - 2022**
**-------------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 ව්‍යාවනය කළ මතය

කල්මුණ මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.6 කොටසේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මාහට නොහැකි විය.

### 1.2 ව්‍යාවනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාවනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු

කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **මහා** නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා තාවකාලික සේවක වැටුප්, සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක මුදල් වෙනුවෙන් ගෙවිය යුතු එකතුව රු.2,991,047ක් මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලෙස දක්වා නොතිබුණි. | ඉදිරියේ දී EPF සහ ETF ගෙවීම් නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයේ ගෙවිය යුතුව තිබූ වාහන අලුත්වැඩියා වියදම්,අතිකාල දීමනා, පුවත්පත් මිලදී ගැනීම් සහ වාහන අමතර කොටස් මිලදී ගැනීම් ආදියෙහි වටිනාකම රු. 3,909,502 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේදී වටිනාකම් ලබා ගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2021 සහ 2022 වසරවල මහා නගර සභාවට පරිත්‍යාග ලෙස ලබාදුන් භාණ්ඩ 07 ක වටිනාකම රු. 303,104 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | පරිත්‍යාගයක් ලෙස ලැබූ භාණ්ඩවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කර ඇති බව. | අදාළ වර්ෂය තුළ පරිත්‍යාග ලෙස ලැබුණු භාණ්ඩවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | | විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | (i) | ඉඩම් ගොඩනැගිලි | 701,271,237 | ඉඩම් ඔප්පු | මේ සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට අදාල කටයුතු සිදු කර ඇත. මේවා සම්පූර්ණවූ පසු වාර්තා කරන බව. | කඩිනමින් තොරතුරු ලබා ගෙන අදාල ලේඛන නිසි පරිදි පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය. |
| | (ii) | පිරියත හා උපකරණ | | ස්ථාවර වත්කම් ලේඛනය | මේ සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට අදාල කටයුතු සිදු කර ඇත. මේවා සම්පූර්ණවූ පසු වාර්තා කරන බව. | කඩිනමින් තොරතුරු ලබා ගෙන අදාල ලේඛන නිසි පරිදි පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය. |
| | (iii) | මෝටර් රථ හා කරත්ත | | | | |
| | (iv) | ලී බඩු හා සවිකිරීම් | | | | |
| | (v) | කාර්යාල උපකරණ | | | | |
| | (vi) | මාර්ග | | මාර්ග ලේඛනය | | |
| | (vii) | රාජ්‍ය භාග ණයකරුවන් | 701,271,237 | හිඟ උපලේඛන සහ කාල විශ්ලේෂණ | | |
| | (viii) | අත්තිකාරම් | | අත්තිකාරම් ලේඛනය | | |
| | (ix) | ගෙවිය යුතු විදුලි භාණ්ඩ සැපයීම් | | ලේඛනය | | |
| (ආ) | | ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂය | 32,954,838 | සවිස්තරාත්මක වර්ගීකරණ උපලේඛන සහ කාල විශ්ලේෂණය | තැන්පතු විශ්ලේෂණය දැනට විගණනය සඳහා ඉදිරිපත් කෙරේ. | සවිස්තරාත්මක වර්ගීකරනය කළ විශ්ලේෂණ වාර්තාව සහ එහි කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඇ) | (i) | වෙළඳ බලපත්‍ර ගාස්තු | 637,798,571 | හිඟ ආදායම්වල විස්තරාත්මක උපලේඛන සහ ඒවායේ පාලන ගිණුම් | මහා නගර සභාවේ භාවිතා කරන මෘදුකාංගවල පවතින දෝෂ මෙයට හේතුවේ. එය නිවැරදි කිරීමට දැන් පියවර ගෙන ඇති බව. | සවිස්තරාත්මක වර්ගීකරනය කළ විශ්ලේෂණ වාර්තාව සහ එහි කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| | (ii) | කසළ බැහැර කිරීමේ බදු | | හිඟ ආදායම්වල විස්තරාත්මක උපලේඛන සහ ඒවායේ පාලන ගිණුම් | මහා නගර සභාවේ භාවිතා කරන මෘදුකාංගවල පවතින දෝෂ මෙයට හේතුවේ. එය නිවැරදි කිරීමට දැන් පියවර ගෙන ඇති බව. | |
| | (iii) | කුලී | | | | |
| | (iv) | වරිපනම් හා බදු | | | | |
| | (v) | වෙනත් ආදායම් | 637,798,571 | | | |
| | (vi) | දැන්වීම් පුවරු ගාස්තු | | | | |
| | (vii) | සෝතකාතාර ගාස්තු | | | | |
| | (i) | විදුලි ගබඩා භාණ්ඩ | | විස්තරාත්මක උපලේඛන සහ ඒවායේ පාලන ගිණුම් | අදාල වෙනස නිවැරදි කිරීමට පියවර ගනු ලැබන බව. | විස්තරාත්මක උපලේඛන සහ පාලන ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |
| | | | 59,560,540 | | | |
| (ඇ) | (ii) | සේවක ණය | | විස්තරාත්මක උපලේඛන සහ ඒවායේ පාලන ගිණුම් | අදාල වෙනස නිවැරදි කිරීමට පියවර ගනු ලැබන බව. | |
| | (iii) | රාජ්‍ය භාග ණයකරුවන් | | | | |
| | (iv) | ආපසු නොගෙවන තැන්පතු | | | | |
| | (v) | ගෙවියයුතු ටිපිං | | | | |
| | (vi) | සමුච්චිත අරමුදල (මහා නගර සභා අරමුදල) | 59,560,540 | | | |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.**

| | **නීති, රීති, රෙගුලාසි, කළමනාකරණ තීරණවලට ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනත, 252 අධිකාරියේ 155 වගන්තිය | මහා නගර සභාවට අයත් කල්මුණේ පොදු වෙළෙඳ පොළ ගොඩනැඟිලි සංකීර්ණයේ පිහිටි වෙළෙඳසල් 587ක් සඳහා අයකරනු ලබන කුලී මුදල් කාලීනව තක්සේරු කර අය කිරීමට කටයුතු කර නොතිබුණි. | සමහර කඩවල කුලිය වැඩි කර අලුත් ගිවිසුම් අත්සන් කර ඇත. අනෙකුත් වෙළඳසැල් සඳහා ගිවිසුම් අලුත් කර කුලිය වැඩි කිරීමට කටයුතු කර ඇති බව. | ආඥා පනතට අනුව, කඩවලට අය කරන කුලී මුදල කාලීනව තක්සේරු කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක EP/01/CMA/ Cabinet.Memo/007 හා 2020.07.10 දිනැති ලිපිය | දේපළ බදු අයකිරීමට මහා නගර සභා බල ප්‍රදේශයේ පවතින නිශ්චල දේපළ වසර 05කට වරක් තක්සේරු කළ යුතු වුවද මහා නගර සභාව සතු දේපල ඒකක 46,303කින් 2011 හා 2012 වර්ෂවල තක්සේරු අගයන් පදනම් කරගෙන බදු අයකිරීම් සිදු කර තිබුණි. | මේ වනවිට අලුතින් තක්සේරු කිරීමටව ඉල්ලුම් කර දත්ත යවා ඇත. ඉකුත් වර්ෂයේ අදාල තක්සේරුව මහා සභාව සිදු කළයුතු බව. | ලිපියට අනුව, නිශ්චල දේපළ වසර 05 කට වරක් තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 අගෝස්තු 16 දිනැති අංක PT/03/2021 නැගෙනහිර පළාත් මුදල් චක්‍රලේඛය | මුදල්, ගබඩා භාණ්ඩ, රාජ්‍ය භාග අයවීම් සහ චෙක්පත් අත්සන් කිරීමේ රාජකාරි සඳහා වගකිව යුතු නිලධාරීන් 10 දෙනකුගෙන් රු. 107,500 ක ආරක්ෂක ඇප මහා නගර සභාව විසින් ලබා ගෙන නොතිබුණි. | අදාල කරුණු සම්බන්ධයෙන් සියලුම තනතුරුවල නිලධාරීන්ට, මේ සම්බන්ධයෙන් උපදෙස් ලබාදී ඇති බව. | චක්‍රලේඛයට අනුව, අදාළ නිලධාරීන්ගෙන් ආරක්ෂක ඇප අය කිරීමට පියවර ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම ඉක්ම වූ ආදායම රු. 59,202,514 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම් ඉක්මවූ ආදායම රු. 5,123,295 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව මහා නගර සභාව විසින් ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2023** | | | | **2022** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 51,730,000 | 168,405,120 | 25,401,677 | 143,003,442 | 297,110,000 | 130,490,677 | 14,748,476 | 115,742,203 |
| (ii) | කුලී | 24,754,000 | 81,586,027 | 26,982,674 | 54,603,351 | 30,444,000 | 64,823,698 | 12,286,390 | 52,537,308 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 28,310,000 | 8,283,618 | 8,283,618 | - | 28,305,000 | 7,635,000 | 7,635,000 | - |
| (iv) | වෙනත් ආදායම් | 67,765,000 | 14,483,818 | 14,483,818 | - | 54,160,000 | 39,000,000 | 39,000,000 | - |
| (v) | එකතුව | **172,559,000** | **272,758,583** | **75,151,787** | **197,606,793** | **410,019,000** | **241,949,375** | **73,669,866** | **168,279,511** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | සමාලෝචිත වර්ෂය සඳහා මුළු බිල් කළ ආදායම රු.272,758,583ක් වුවද ඉන් අයකරගෙන තිබුණේ රු. 75,151,787ක් පමණි. ඒ අනුව එම ප්‍රතිශතය සියයට 27ක් තරම් අඩු ප්‍රතිශතයක් විය. | රටේ පැවති කොරෝනා වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් බදු අයකර ගැනීමේ දැවැන්ත දුෂ්කරතාවය නිසා අඩු ආදායමක් ලැබී තිබුණි. ඉදිරි කාලවලදී නිවැරදි කරන බව. | අයවිය යුතු හිඟ ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| (i) | කල්මුණ පොදු වෙළෙඳ පොළේ ගොඩනැඟිලි සංකීර්ණයේ පිහිටි වෙළෙඳසැල් කුලියට දීම වෙනුවෙන් කුලීහිමියන් 587 දෙනකුගෙන් අයවිය යුතු රු. 19,050,885ක මුදල වසර 5කට අධික කාලයක සිට අයකිරීමට මහා නගර සභාව කටයුතු කර නොතිබුණි. | වසරකට 3 වතාවක් ලිපි යවනු ලබන අතර ආදායම් පරීක්ෂකයන් විසින් හිඟ අයකරනු ලැබේ. මේ වන විට හිඟ අඩුවෙන් පෙන්නුම් කරන බව. | අයවිය යුතු හිඟ ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | සභාවේ රජයේ බස් නැවතුම්පළ සඳහා වෙළෙඳසැල් කාමර 02 ක් ලංකා ගමනාගමන මණ්ඩලයට බදු දීමට අදාළව එම මණ්ඩලයෙන් අයවිය යුතු හිඟ රු. 1,451,000 ක මුදල වසර 05 වැඩි කාලයක සිට අයකිරීමට මහා නගර සභාව කටයුතු කර නොතිබුණි. | මෙම වෙළෙඳසැල්වලට එරෙහිව නීතිමය පියවර ගැනීමට තීරණය කර ඇත. | අයවිය යුතු හිඟ මුදල් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ බදු රු. 7,200,000ක් ඇස්තමේන්තු කර, එයින් රු. 4,441,373ක මුදලක් අයකර තිබුණි. | රටේ ආර්ථික පරිහානිය නිසා සාමාන්‍ය ජනතාවගෙන් බදු අයකර ගැනීම ඉතා දුෂ්කර බැවින් අඩු ආදායමක් ලබා ගැනීමට හැකි විය. | නිසි ලෙස ලේඛන නඩත්තු කර ආදායම් අයකිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් රැස්කිරීම සඳහා 2020 ජනවාරි 01 දින සිට භාවිතා කරමින් පවතින පරිගණක ගත ආදායම් මෘදුකාංග පද්ධතිය විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව මිලදී ගැනීම සහ අභ්‍යන්තර පාලනයක් සහ අභ්‍යන්තර විගණනයක් නොමැතිකම හේතුවෙන් දෛනිකව අය කළ ආදායම් සම්පූර්ණයෙන්ම මහා නගර සභා ගිණුම්වල තැන්පත් නොකර ආදායම් මූලාශ්‍ර 9කින් අයකර තිබුණු රු. 18,094,795ක මුදලක් වංචා කර තිබුණි. | නඩුව විභාග වෙමින් පවතින බැවින් ඒ සඳහා තීන්දුව ලැබෙන තෙක් මහානගර සභාවට සිදුවී ඇති පාඩුව සම්බන්ධයෙන් වූ ලේඛන විගණනය සඳහා ඉදිරිපත් කිරීමට නොහැකි බව. | අදාළ මෘදුකාංගය පිළිගත් සමාගමකින් මිලදීගෙන, වගකිවයුතු සුදුසුකම් ලත් නිලධාරීන් යොදවා, නිසි පරිදි ලේඛන පවත්වාගෙන යා යුතු අතර, වංචාවට වගකිව යුතු පාර්ශ්වයන්ට විනය ක්‍රියාමාර්ග ගෙන, පාඩුව ඔවුන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ග්‍රාමීය සංවර්ධන බැංකුවේ ස්ථාවර තැන්පතු ලෙස රු. මිලියන 32ක් 2018 දෙසැම්බර් 10 දින සිට 2019 දෙසැම්බර් 10 දක්වා සියයට 12.5 ක පොලී අනුපාතයක් යටතේ තිබුණු තැන්පතුව කල්පිරී තිබුණද, 2022 වර්ෂය අවසානය දක්වාම අලුත්නොකර තිබුණි. කෙසේ වෙතත්, 2022 වර්ෂයේ දී වෙළඳපොල පොලී අනුපාතය සියයට 20 සිට සියයට 24 දක්වා ඉහළ යාම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 2,400,000 ක පොලී ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | මෙම කාල පරිච්ඡේදය සභාවට අදාළ කාලයයි මෙම කාලයේ නගරාධිපතිවරයා විසින් ප්‍රධාන ලේකම්වරයාගෙන් ඉල්ලා සිටි ලිපියක් මෙම ගොනුවේ දක්නට තිබේ. මෙයට අනුව තැන්පතුවේ යොදවා ඇත. මෙම ගොනුව සභා තීරණයකින් පසු දැනට පවතින පාලනාධිකාරියට භාරදී ඇති බව. | දැනට පවතින පොලී අනුපාතයට අනුව අදාළ මුදල තැන්පත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 වර්ෂයේ දී කල්මුණේ පොදු වෙළෙඳ පොළ සහ මාළු වෙළෙඳ පොළ බදු දීමට අදාළව, බදුකරු විසින් ඇප බැඳුම්කර සමූපකාර ග්‍රාමීය බැංකුවෙන් රු.5,600,000කට ව්‍යාජ ලෙස සකස් කර ඉදිරිපත් කර තිබුණි. එය මහා නගර සභාව විසින් පරීක්ෂා නොකිරීමෙන් ඇති වූ පාඩුවට මහා නගර සභාවේ නගරාධිපතිවරයාගේ අංක KMC/Mayor/Gen/Let දරන 2022 පෙබරවාරි 22 දිනැති ලිපිය මගින් ඇප බැඳුම්කරය වෙනුවට සමූපකාර ග්‍රාමීය බැංකුවේ චෙක්පත් ලැබෙන තෙක් සාමාන්‍යාධිකාරීවරයාගේ පුද්ගලික චෙක්පත් ඒ වෙනුවෙන් ලැබී තිබුණි. ඒ අනුව සාමාන්‍යාධිකාරීවරයාගෙන් ලැබුණු රු. 2,000,000 වටිනා චෙක්පත් 04 ක් බැංකුවේ තැන්පත් නොකර මහා නගර සභාවේ කල් ඉකුත් වූ චෙක්පත් ලෙස තිබුණි. | ප්‍රධාන ලේකම්වරයා විසින් කමිටුවක් පත් කර දත්ත ලබාගෙන ඇත.මේ සඳහා පිළිතුරු ලැබුණු පසු නීතිමය ක්‍රියාමාර්ග ගෙන සියලුම හිඟ අයකරනු ලබන බව. | ආදායම් අයකිරීමට බාධා ලෙස පැවති සියලුම පාර්ශ්වයන්ගෙන් අයකිරීමට පියවර ගත යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | මහා නගර සභාව සහ පෞද්ගලික මස් කඩ හිමියා අතර ගිවිසුමක් නොමැති නිසා, 2021 සහ 2022 වර්ෂවල දී එක් සතෙකුට රු. 500 බැගින් එකතු කරන ලද සෝතකාගාර ගාස්තු රු. 4,059,000ක මුදල තහවුරු කිරීමට නොහැකිව තිබු අතර, මහා නගර සභා බල ප්‍රදේශයන්හි 2016 සිට 2020 දක්වා කාලය තුළ සතුන් 42,417 සඳහා සෝතකාගාර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. මේ නිසා රු. 21,208,500 ක ආදායමක් අහිමි වී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | නිසි ගිවිසුමක් ඇතිකර සෝතකාගාර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විගණනය සඳහා ලද තොරතුරු අනුව, පෞද්ගලික සෝතකාගාර අයිතිකරු විසින් එක් සතෙකුට රු. 1500 ක මුදලක් ආදායමක් ලෙස අයකල නමුත්, මෙම ස්ථානය නඩත්තු කරගෙන යාම සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් තිබුණද, එම කටයුතු මහා නගර සභාව මගින් සිදු නොකර රු. 500 ක් පමණක් අයකරගෙන තිබීම නිසා, වාර්ෂිකව රු. 8,000,000 ක සාමාන්‍ය ආදායමක් අහිමි වේ. | සෝතකාගාර ඉදිකිරීම් සඳහා මුදල තක්සේරු කර අවසන් කිරීමට තීරණයක් ඉදිරි වර්ෂය සඳහා වන අයවැයෙන් අපේක්ෂා කෙරේ. | සභාවේ සිටින කාර්ය මණ්ඩලය යොදවා කඩිනමින් සෝතකාගාරයක් පිහිටුවා විධිමත් ලෙස ආදායම් අයකිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 10කට වැඩි කාලයක සිට කල්මුණ පොදු වෙළෙඳපොළ ගොඩනැඟිලි කොටසේ ඇති වෙළෙඳසැල් 15ක් සහ පිටුපස තාවකාලිකව පිහිටුවා ඇති වෙළෙඳසැල් 153ක් අලුත්වැඩියා කර කුලියට දීමට මහා නගර සභාව කටයුතු කර නොතිබුණි. | තාවකාලික කඩහිමියන්ගේ සහයෝගය නොලැබීම නිසා එය අලුත්වැඩියා කිරීමට නොහැකි බව. | කඩකාමර අලුත්වැඩියා කර කුලියට දීමට පියවර ගත යුතුය. |
| (ආ) | සභාවට අයත් ප්‍රජා ශාලාව, බස් නැවතුම්පල උඩුමහලේ වෙළඳසැල්, නප්පිට්ටිමුන්න පොදු වෙළඳපොළ උඩුමහලේ වෙළඳසැල්, පෙරිය නීලවානි පොහොර නිෂ්පාදනාගාරය සහ යන්ත්‍රෝපකරණ ආදිය වසර 10 කට අධික කාලයක් නිෂ්කාර්ය පැවතුණි. | වත්කම් පරිහරණය කිරීම සම්බන්ධයෙන් කළමනාකරණ තීරණ ගනු ලැබීමෙන් පසුව ඒවා භාවිතා කිරීම සහ අලුත්වැඩියා කිරීමට කටයුතු කරන බව. | වත්කම් කඩිනමින් භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී වාහන නඩත්තු කිරීම සහ සෝදන ස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම් ඊට අදාළ උපකරණ මිලදී ගැනීම සඳහා රු. 2,264,500 ක මුදලක් වැය කර සම්පූර්ණකර තිබුණද මේ දක්වා අදාළ ස්ථානය භාවිතා කර වාහන නඩත්තු කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ සඳහා ප්‍රධාන Compresser යන්ත්‍රය වන්නේ 3 Phase විදුලිබල සැපයුමට අදාළ වේ. මේ වන විට එය 3 Phase ක සම්බන්ධතාවයක් බවට මාරු කිරීමට කටයුතු කරමින් සිටින බව. | අදාළ ස්ථානය කඩිනමින් භාවිත කර වාහන නඩත්තු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මහා නගර සභාව විසින් 2020 සිට 2022 දක්වා කාලය සඳහා Syntech ආයතනයයෙන් රු. 1,071,100 ක වියදමින් ආදායම් එකතු කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික මෘදුකාංග සහ උපකරණ මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත්, අදාළ සැපයුම්කරු තෝරා ගැනීමට පෙර ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.6 වගන්තියට අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් නොකර, ආයතනයේ අත්දැකීම්, ව්‍යාපාර බලපත්‍රය සහ වාණිජ ලියාපදිංචිය ආදිය සැලකිල්ලට නොගෙන සැපයුම්කරු තෝරාගෙන ප්‍රසම්පාදනය සිදුකර තිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ඔබ විසින් පෙන්වා දුන් අනෙකුත් කරුණු කෙරෙහි අවධානය යොමු නොකිරීම එවකට පාලනාධිකාරියේ වරදකි. දැනට මේ සම්බන්ධයෙන් වංචා නඩුවක් අධිකරණයේ විභාග වෙමින් පවතින බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව, තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර ආයතනයේ පෙර පළපුරුද්ද සහ ව්‍යාපාරික ලියාපදිංචිය සැලකිල්ලට ගනිමින් සැපයුම්කරුවන් තෝරා ගත යුතුය. |

## 3.7 වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහා නගර සභාව විසින් භාවිතා කරන වාහනවල ඉන්ධන පිරිමැස්ම, සේවක කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සහ කසළ බැහැර කිරිමේ ක්‍රියාකාරකම් කඩිනම් කිරීමේ අරමුණින් වාහන අධීක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා 2020 වර්ෂයේදී වාහන 23 කට රු. 455,295 ක වියදමින් ජීපීඑස් (GPS) උපකරණ සවි කර තිබුණද, මෙමගින් අපේක්ෂිත ප්‍රතිලාභ ළඟාකරගත හැකි ආකාරයට කටයුතු නොකිරීම නිසා මෙම වාහන අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදය ආරම්භ කර මාස හයක කාලය තුළ අක්‍රිය වී පැවතුණි. | පසුගිය 2020 වර්ෂයේ දී, GPS උපකරණ සවි කර මාස හයක කාලය තුළ අක්‍රිය වී පැවතුණි. මෙය අළුත්වැඩියාකර නැවත භාවිතා කිරීමට නොහැකි විය. එම කාල වකවානුව කොවිඩ් වසංගතය සහ අසාමාන්‍ය පරිසරයක් පැවැති කාලයක් විය. | අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත හැකි වන පරිදි සුදුසු උපදේශන මාර්ගෝපදේශ සහ අඛණ්ඩ අධීක්ෂණ සිදු කිරීමට ද කටයුතු කළ යුතුය. |
| (ආ) | මහා නගර සභාව සතු වාහන 13 අලුත්වැඩියාකර නැවත භාවිතයට ගැනීමට හෝ සුදුසු ආකාරයට වෙනත් දෙපාර්තමේන්තු වෙත පැවරීමට සභාව කටයුතු කර නොතිබුණි. | අලුත්වැඩියාකර නැවත භාවිතයට ගැනීමට හෝ බැහැර කිරීමට කමිටු පිහිටුවා කටයුතු කරනු ලැබේ. | අලුත්වැඩියාකර නැවත භාවිතයට ගැනීමට හෝ වෙනත් දෙපාර්තමේන්තු වෙත පැවරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජූනි 09 දිනැති අංක DMA/2009(1) අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛයට අනුව සමාලෝචිත වර්ෂයේ සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | සභාව අවසන් වීමෙන් පසු මේ පිළිබඳව පූර්ණ අවධානය යොමු කර දැනට සියලු කටයුතු කළමණාකාර කමිටුවේ තීරණය හරහා සිදු කරන බව. | චක්‍රලේඛයට අනුව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |